**ශීර්ෂය 2 – අග්‍රාමාත්‍ය කාර්යාලය**

**------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1 මතය**

**------**

අග්‍රාමාත්‍ය කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අග්‍රාමාත්‍ය කාර්යාලය මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 22 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත 2021 ඔක්තෝබර් 29 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අග්‍රාමාත්‍ය කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශවලින් 2020 දෙසැම්බර් 31 දිනට අග්‍රාමාත්‍ය කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**-------------------**--

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා  සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා  අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී.  වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන  බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙණු හා සිද්ධීන් උචිත සහ සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රාග්ධන වැය විෂයයන් දෙකක් සඳහා වෙන්කරන ලද එකතුව රු. 44,500,000 ක් වූ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් තාත්වික හා ඵලදායී ලෙස පිළියෙල කිරීමේ අවශ්‍යතාවය |

**2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | | |
| රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10:1 ඡේදයට අනුගතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල මාර්ගෝපදේශ අංක 6 (අ) | දෙපාර්තමේන්තු පොත් අනුව ආදායම් නොවන ලැබීම් රු. 11,570,319 ක් වුවත් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි රු. 99,570 ක් ලෙස දැක්වීම නිසා ශුද්ධ මුදල් ප්‍රවාහයෙහි රු.11,470,749 ක වෙනසක් නිරීක්ෂණය විය. | මුදලින් ලැබීම් පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුලත් කර ඇති බව | මාර්ගෝපදේශයට අනුව කටයුතු කලයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙපාර්තමේන්තු පොත් අනුව වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම රු. 5,373,182 ක් ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි රු. 4,739,183 ක් ලෙස දැක්වීම හේතුවෙන් ශුද්ධ මුදල් ප්‍රවාහයෙහි රු. 633,999 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | -එම- |
| (ඇ) | දෙපාර්තමේන්තු පොත් අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් සඳහා දරන ලද වියදම රු. 827,475,393 ක් වුව ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි එය රු. 809,627,577 ක් ලෙස රු. 17,847,816 ක් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | දෙපාර්තමේන්තු පොත් අනුව තැන්පතු ගෙවීම් හා තැන්පතු ලැබීම් පිළිවෙලින් රු.12,429,740 ක් හා රු. 12,608,604 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ තැන්පතු ගෙවීම් රු. 11,822,540 ක් හා තැන්පතු ලැබීම් රු. 11,873,427 ක් ලෙස දැක්වීම හේතුවෙන් පිළිවෙලින් මුදල් ගලායාම රු. 607,206 කින් අඩුවෙන් හා මුදල් ගලා ඒම රු. 735,177 කින් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | වර්ෂය තුල භෞතික වත්කම් ඉදිකිරීම සඳහා දරන ලද වියදම රු.67,439,583 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල රු.65,514,746 ක් ලෙස දැක්වීම නිසා ශුද්ධ මුදල් ප්‍රවාහයෙහි රු.1,924,837 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | -එම- |
| (ඊ) | දෙපාර්තමේන්තු පොත් අනුව අත්තිකාරම් ගෙවීම් රු. 37,646,754 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි රු. 10,605,985 ක් ලෙස දැක්වීම හේතුවෙන් ශුද්ධ මුදල් ප්‍රවාහයෙහි රු. 27,040,769 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | -එම- |
| (උ) | දෙපාර්තමේන්තු පොත් අනුව අත්තිකාරම් අයකර ගැනීම් රු. 36,435,255 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු. 586,554 ක් ලෙස දැක්වීම හේතුවෙන් ශුද්ධ මුදල් ප්‍රවාහයෙහි රු.35,848,701 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | -එම- |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අංක PFD/RFD/01/04/2014/01 හා 2014 පෙබරවාරි 17 දිනැති මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම තුළ දක්වා ඇත. එහෙත් 2020 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ, අදාළ වර්ෂයට යාවත්කාලීන කල ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම යනාදිය ඇතුළත් කර නොතිබුණි. | ඉදිරියේදී එම සැලසුම් අන්තර්ගතකොට එක් ක්‍රියාකාරී සැලැස්මක් වශයෙන් පිළියෙල කිරීමට කටයුතු කරන බව | අදාල චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු වීම. |

**3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

පහත සඳහන් කරුණ නිරීක්ෂණය කෙරේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධානගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ක්‍රියාකාරී සැලැස්මේ සංහිඳියා ක්ෂේත්‍රය යටතේ දක්වා තිබූ සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය මඟින් සම්බන්ධීකරණය කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රගතියක් නිරීක්ෂණය නොවුණි. | 2020 මාර්තු 31 දිනෙන් සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලයේ කටයුතු අවසන් වී ඇති බැවින් ඒ සඳහා ප්‍රගතියක් ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව | 2020 වර්ෂයේදීද මාස 03 ක් ක්‍රියාත්මක වී ඇති බැවින් හා එහි කටයුතු එම වර්ෂයේ අවසන් වී ඇති බැවින් එහි ප්‍රගතිය දැක්වීමට කටයුතු කලයුතු වීම. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් කරුණ නිරීක්ෂණය කෙරේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට සමස්ත පුරප්පාඩු සංඛ්‍යාව 192 ක් එනම් අනුමත සංඛ්‍යාවෙන් සියයට 30 ක් වූ අතර ඒ තුළ ද්විතියික මට්ටමේ පුරප්පාඩු 81 ක් විය. | වැඩි පිරිසකගේ ආරක්ෂක නිෂ්කාෂන වාර්තා ලබාගැනීමට සිදු වීමත්, රටේ පැවති අයහපත් සෞඛ්‍යමය වාතාවරණය තුළ කාර්ය මණ්ඩලය බඳවාගැනීම සඳහා යම් ප්‍රමාදයක් සිදු වූ බව | කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට අහිතකර අයුරින් බලපාන්නේ නම් එම පුරප්පාඩු පිරවීමට හෝ එසේ නොමැති නම් අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කලයුතු වීම. |